## සෞඛ්‍ය අමාත්‍යාංශය

## කොවිඩ්-19 වසංගතය අතරතුර දී විදේශයන් හි සිට පැමිණෙන මගීන් සඳහා නිරෝධායන පියවර

පැමිණෙන සියලුම මගීන් හෝ සංචාරකයින් රට තුළට ඇතුළු වීම සඳහා පිළිවෙලින් විදේශ අමාත්‍යාංශයෙන් හා වෙනත් අදාළ බලධාරීන්ගෙන් හෝ ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයෙන් අනුමැතිය ලබා ගත යුතුය.

සියලුම මගීන් විසින් සම්පූර්ණ කරන ලද සෞඛ්‍ය ප්‍රකාශන ආකෘති පත්‍රය තමන් පැමිණෙන ගුවන් තොටුපළේ සෞඛ්‍ය කවුන්ටරවල ගුවන් තොටුපළ සෞඛ්‍ය කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

**1. ශ්‍රී ලාංකික පුරවැසියන්/ ද්විත්ව පුරවැසියන් සහ විදේශිකයන් සඳහා නිරෝධායන පියවර**

**අ) කොවිඩ්-19 එන්නතෙහි නිර්දේශිත මාත්‍රාවන් සම්පූර්ණ කොට, එන්නත ලබාගෙන සති දෙකකට පසුව පැමිණෙන මගීන්**

1. කොවිඩ්-19 එන්නත සඳහා නිර්දේශිත මාත්‍රාවන් ලබා සිටිය යුතුය.
2. කොවිඩ්-19 එන්නත අවසන් කිරීමෙන් සති දෙකකට පසු පැමිණිය යුතුය.
3. පැමිණෙන විට, එන්නත් සහතිකයේ මුල් පිටපත, එම සහතිකය ඉංග්‍රීසි භාෂාවෙන් නොමැති නම්, එහි ඉංග්‍රීසි භාෂා පරිවර්තනයේ සහතික කළ පිටපතක් ද සමඟ ගුවන්තොටුපල සෞඛ්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය.
4. ඔවුන් රජයේ බලධාරීන් විසින් නිරෝධායන හෝටලයකට/ මධ්‍යස්ථානයකට ප්‍රවාහනය කළ යුතුය.
5. පැමිණ පැය 24 ක් ඇතුළත (පළමු දින) සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමත පෞද්ගලික අංශයේ රසායනාගාරකින්/ රාජ්‍ය අංශයේ රසායනාගාරයකින් කොවිඩ්-19 PCR පරීක්ෂණයක් කළ යුතුය.
6. එම PCR වාර්තාව ලබා ගත් පසුව, PCR සාම්පල එකතු කිරීමේ දිනය සහ PCR පරීක්ෂණයේ ප්‍රතිඵල සඳහන් කරමින් හෝටලයේ/ මධ්‍යස්ථානයේ නිරෝධායන අධිකාරිය විසින් මුදා හැරීමේ ලේඛනයක් නිකුත් කිරීම මගින් ඔවුන් නිරෝධායන හෝටලයෙන්/ මධ්‍යස්ථානයෙන් මුදා හැරිය හැකිය.
7. ඔවුන් නිරෝධායන හෝටලයෙන්/ මධ්‍යස්ථානයෙන් තම නිවෙස් කරා යාමේ සඳහා තමන්ගේම ප්‍රවාහන ක්‍රමයක් සකසා ගත යුතු වන අතර, ඔවුන්ගේ ගමන් පුරාම කොවිඩ්-19 වැළැක්වීමේ පියවර අනුගමනය කළ යුතුය.
8. තම නිවසට පැමිණි විගසම ඔවුන් වහාම ඒ බව ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීට (MOH) දුරකථනයෙන් හෝ විද්‍යුත් තැපැලෙන් දැනුම් දී හෝටලයේ/ මධ්‍යස්ථානයේ දී නිරෝධායන අධිකාරිය විසින් නිකුත් කරන ලද මුදා හැරීමේ ලේඛනය ඉදිරිපත් කළ යුතුය.

9. මගියා එන්නත සම්පූර්ණ කර ඇති අතර, පැමිණීමේ පළමු දිනයේ දී සෘණාත්මක PCR වාර්තාවක් ද ඇති බැවින්, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දීමෙන් පසුව, ඔවුන් තවදුරටත් නිරෝධායනය කිරීමට අවශ්‍ය නොවේ.

10. ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් විස්තර (මගියාගේ නම, විදේශ ගමන් බලපත්‍ර අංකය, ශ්‍රී ලංකාවට පැමිණි දිනය හා වේලාව, නිවසේ/ පදිංචි ස්ථානයේ ලිපිනය, දුරකථන අංකය, නිවසට පැමිණි දිනය) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ සහ වසංගත රෝග විද්‍යා ඒකකය (chepid@sltnet.lk සහ samithag@hotmail.com) වෙත විද්‍යුත් තැපෑලෙන් යැවිය යුතුය.

11. සියලුම මගීන් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු හත්වැනි දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමත පෞද්ගලික අංශයේ රසායනාගාරයකින්/ රාජ්‍ය අංශයේ රසායනාගාරයකින් නැවත PCR පරීක්ෂණයක් කළ යුතුය.

12. උණ හෝ කොවිඩ්-19 හි ශ්වසන රෝග ලක්ෂණ පෙන්නුම් කරන්නේ නම්, වහාම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතුය.

13. සියලුම PCR පරීක්ෂණ ප්‍රතිඵල වහාම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතු අතර, ඒවා ලද වහාම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ සහ වසංගත රෝග විද්‍යා ඒකකය වෙත (ඉහත දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපිනයන්ට) විද්‍යුත් තැපෑලෙන් යැවිය යුතුය.

14. PCR පරීක්ෂණ ප්‍රතිඵලය ධනාත්මක නම්, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිකාර ක්‍රියා පිළිවෙත අනුගමනය කළ යුතුය.

**ආ) කොවිඩ්-19 එන්නත ලබා නොගත්/ නිර්දේශිත එන්නත් මාත්‍රාව සම්පූර්ණ නොකළ/ එන්නත් කොට සති දෙකකට අඩු කාලයක් තුළ ශ්‍රී ලංකාවට පැමිණෙන මගීන්**

**i) හෝටල්වල දී නිරෝධායනයට භාජනය වන මගීන් (තනිව හෝ තම පවුලේ සාමාජිකයන් සමඟ)**

1. කොවිඩ්-19 PCR පරීක්ෂණ පළමු හා හත්වැනි දිනවල දී සිදු කළ යුතුය.
2. ප්‍රතිඵල ලැබුණු පසුව පරීක්ෂණ දෙකම සෘණාත්මක නම්, හත්වැනි දිනය අවසන් වූ පසු හෝටලයෙන් මුදා හැරිය හැකිය.
3. නිරෝධායන හෝටල්වලින් නිවෙස් කරා යාම සඳහා ඔවුන් තම පුද්ගලික ප්‍රවාහන ක්‍රමවේදය සකස් කර ගත යුතු වන අතර, ඔවුන්ගේ ගමන් පුරාම කොවිඩ්-19 වැළැක්වීමේ පියවර අනුගමනය කළ යුතුය.
4. වාහනවල රියදුරන් සුදුසු පුද්ගලික ආරක්ෂක උපකරණ පැළඳිය යුතු වන අතර, මගීන් ප්‍රවාහනය කිරීමේ දී කොවිඩ්-19 වැළැක්වීමේ පියවර අනුගමනය කළ යුතුය.

5. තම නිවසට පැමිණි විගසම, ඔවුන් ඒ බව වහාම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) වෙත දුරකථනයෙන් හෝ විද්‍යුත් තැපැලෙන් දැනුම් දී, නිරෝධායන අධිකාරිය විසින් නිකුත් කරන ලද මුදා හැරීමේ ලේඛනය, නිරෝධායන හෝටලයේ දී PCR සාම්පල එකතු කිරීමේ දිනයන් සහ පළමු සහ හත්වැනි දිනවල PCR පරීක්ෂණ ප්‍රතිඵල සඳහන් කරමින් ඉදිරිපත් කළ යුතුය.

6. ඉතිරි නිරෝධායන කාලය (දින 14 න්) අනිවාර්යයෙන්ම නිවසේ දී නිරෝධායනය විය යුතුය.

7. නිරෝධායන කාලය තුළ දී උණ හෝ කොවිඩ්-19 හි ශ්වසන රෝග ලක්ෂණ පෙන්නුම් කරන්නේ නම්, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතුය.

8. පළමු දින හෝ හත්වැනි දින PCR පරීක්ෂණ ප්‍රතිඵල ධනාත්මක නම්, එම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිකාර ක්‍රියා පිළිවෙත අනුගමනය කළ යුතුය.

**ii) හවුල් පහසුකම් සහිත මධ්‍යස්ථානයක දී නිරෝධායනයට භාජනය වන මගීන්**

1. කොවිඩ්-19 PCR පරීක්ෂාව පළමු හා දහවැනි දිනවල දී සිදු කළ යුතුය.

2. ප්‍රතිඵල ලබා ගත් පසුව පරීක්ෂණ දෙකම සෘණාත්මක නම්, දහවැනි දිනය සම්පූර්ණ කිරීමෙන් පසු නිරෝධායන මධ්‍යස්ථානයෙන් මුදා හැරිය හැකිය.

3. නිරෝධායන මධ්‍යස්ථානවලින් නිවෙස් කරා යාම සඳහා ඔවුන් තම පුද්ගලික ප්‍රවාහන ක්‍රමවේදය සකස් කර ගත යුතු වන අතර, ඔවුන්ගේ ගමන් පුරාම කොවිඩ්-19 වැළැක්වීමේ පියවර අනුගමනය කළ යුතුය.

4. වාහනවල රියදුරන් සුදුසු පුද්ගලික ආරක්ෂක උපකරණ පැළඳිය යුතු අතර, මගීන් ප්‍රවාහනය කිරීමේ දී කොවිඩ්-19 වැළැක්වීමේ පියවර අනුගමනය කළ යුතුය.

5. තම නිවසට පැමිණි විගසම ඔවුන් වහාම ඒ බව ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) වෙත දුරකථනයෙන් හෝ විද්‍යුත් තැපැලෙන් දැනුම් දිය යුතු වන අතර, නිරෝධායන මධ්‍යස්ථානයේ නිරෝධායන අධිකාරිය විසින් නිකුත් කරන ලද මුදා හැරීමේ ලේඛනය, PCR සාම්පල එකතු කිරීමේ දිනයන් සහ පළමු හා දසවැනි දිනවල PCR පරීක්ෂණ ප්‍රතිඵල සඳහන් කරමින් ඉදිරිපත් කළ යුතුය.

6. ඉතිරි නිරෝධායන කාලය (දින 14 න්) අනිවාර්යයෙන්ම නිවසේ නිරෝධායනය විය යුතුය.

7. නිරෝධායන කාල සීමාව තුළ දී උණ හෝ කොවිඩ්-19 හි ශ්වසන රෝග ලක්ෂණ පෙන්නුම් කරන්නේ නම්, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත වහාම දැනුම් දිය යුතුය.

8. පළමු හෝ දහවැනි දිනයේ PCR පරීක්ෂණ ප්‍රතිඵල ධනාත්මක නම්, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිකාර ක්‍රියා පිළිවෙත අනුගමනය කළ යුතුය.

## 2. ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය හරහා විදේශයන් හි සිට පැමිණෙන සංචාරකයින් සඳහා නිරෝධායන පියවර

සංචාරකයින් https://www.srilanka.travel/helloagain/ වෙබ් අඩවිය හරහා ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයෙන් අනුමැතිය ලබා ගත යුතුය. ශ්‍රී ලංකා රජය විසින් සංචාරකයින් සඳහා පනවා ඇති මාර්ගෝපදේශ පිළිපැදිය යුතුය.

**අ) කොවිඩ්-19 එන්නතෙහි නිර්දේශිත මාත්‍රාවන් සම්පූර්ණ කොට, එන්නත ලබාගෙන සති දෙකකට පසුව පැමිණෙන සංචාරකයින්**

1. පැමිණෙන විට, එන්නත් සහතිකයේ මුල් පිටපත, එම සහතිකය ඉංග්‍රීසි භාෂාවෙන් නොමැති නම්, එහි ඉංග්‍රීසි භාෂා පරිවර්තනයේ සහතික කළ පිටපතක් ද සමඟ ගුවන්තොටුපල සෞඛ්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය.
2. සංචාරකයින් සඳහා සහතික කළ හෝටලයක දී සංචාරකයින් නිරෝධායනය විය යුතුය.
3. පැමිණ පැය 24 ක් ඇතුළත (පළමු දින) සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමත පෞද්ගලික අංශයේ රසායනාගාරයකින් කොවිඩ්-19 PCR පරීක්ෂණයක් කළ යුතු අතර, එම පෞද්ගලික රසායනාගාරයේ කණ්ඩායම විසින් හෝටලයේ දී සාම්පල එකතු කිරීම කළ යුතුය.
4. පැමිණීමේ පළමු දිනයේ දී සංචාරකයින්ගේ තොරතුරු ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) වෙත දැනුම් දීමට හෝටල් කළමනාකාරිත්වය පියවර ගත යුතු අතර, PCR පරීක්ෂණ වාර්තාවල ඡායා පිටපත් ලබා දිය යුතුය.
5. සංචාරකයා විසින් එන්නත් සහතිකයේ මුල් පිටපත, එය ඉංග්‍රීසි භාෂාවෙන් නොමැති නම් එහි සහතික කළ ඉංග්‍රීසි භාෂා පරිවර්තනයක් ද සමඟ හෝටල් කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කළ යුතුය. හෝටල් කළමනාකාරිත්වය විසින් එම එන්නත් සහතිකයේ ඡායා පිටපතක් තබා ගත යුතු වන අතර, එවැනි එන්නත් කළ සංචාරකයින්ට පමණක් මෙම කාණ්ඩය යටතේ ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අවසර දීමට වගබලා ගත යුතුය.
6. පළමු දිනයේ PCR පරීක්ෂණ ප්‍රතිඵලය සෘණාත්මක වන්නේ නම්, සංචාරකයින් හත්වැනි දිනය අවසන් වන තෙක් එම හෝටලයේම රැඳී සිටිය යුතු වන අතර, පළමු දින PCR වාර්තාව ලද පසුව, පැමිණි දිනයේ සිට දින හතක් දක්වා ජෛව ආරක්ෂණ බුබුලක් තුළ අනුමත වැදගත් ස්ථාන නැරඹිය හැකිය.
7. උණ හෝ කොවිඩ්-19 හි ශ්වසන රෝග ලක්ෂණ පෙන්නුම් කරන්නේ නම්, වහාම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතුය.
8. දින හතක් සම්පූර්ණ කිරීමෙන් පසුව, හත්වැනි දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමත පෞද්ගලික අංශයේ රසායනාගාරයක් විසින් නැවත PCR පරීක්ෂණයකට භාජනය කළ යුතු අතර, පරීක්ෂණයේ ප්‍රතිඵල සෘණාත්මක නම්, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙතින් නිෂ්කාශනය

ලබා ගැනීමෙන් පසුව ඔවුන්ට හෝටලයෙන් පිටව යා හැකි අතර, සංචාරක නියෝජිතයා සමඟ ඔවුන්ගේම ගමන් සැලැස්මක් ඇති කර ගත හැකිය.

9. PCR පරීක්ෂණ ප්‍රතිඵලය ධනාත්මක නම්, හෝටල් කළමනාකාරිත්වය විසින් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිකාර ක්‍රියා පිළිවෙත අනුගමනය කළ යුතුය.

**ආ) කොවිඩ්-19 එන්නත ලබා නොගත්/ නිර්දේශිත එන්නත් මාත්‍රාව සම්පූර්ණ කර නොමැති/ එන්නත් කර සති දෙකකට අඩු කාලයක් තුළ ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්**

1. සංචාරකයින් සඳහා සහතික කළ හෝටලයක අනිවාර්යයෙන්ම නිරෝධායනය විය යුතුය.
2. පැමිණ පැය 24 ක් ඇතුළත (පළමු දින) සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමත පෞද්ගලික අංශයේ රසායනාගාරයකින් කොවිඩ්-19 PCR පරීක්ෂණයක් කළ යුතු වන අතර, එම පෞද්ගලික අංශයේ රසායනාගාර කණ්ඩායම හෝටලයේ දී සාම්පල එකතු කිරීම කළ යුතුය.
3. පැමිණීමේ පළමු දිනයේ දී සංචාරකයින්ගේ තොරතුරු ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) වෙත දැනුම් දීමට හෝටල් කළමනාකාරිත්වය විසින් පියවර ගත යුතු අතර PCR පරීක්ෂණ වාර්තාවල ඡායා පිටපත් ලබා දිය යුතුය.
4. සංචාරකයා දින දහහතරකට අඩු කාලයක් තුළ දී ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන්නේ නම්, පිටත්ව යන දිනය අනුව දෙවැනි PCR පරීක්ෂණය සිදු කළ යුතු වන අතර, අවම වශයෙන් පිටත්ව යාමට පෙර සෘණාත්මක වාර්තාවක් තිබිය යුතුය (උදා: සංචාරකයා අටවැනි දින දී පිටත්ව යන්නේ නම්, දෙවැනි PCR පරීක්ෂණය 6 සිට 7 දක්වා දිනක දී සිදුකළ යුතුය).
5. සංචාරකයා ශ්‍රී ලංකාවේ පැය 96 කට (පැය අනූ හයක්) වඩා අඩු කාලයක් රැඳී සිටින්නේ නම්, පිටවීමේ දී PCR පරීක්ෂණ පැවැත්වීම අවශ්‍ය නොවන අතර, එය අවශ්‍ය වන්නේ ගුවන් ගමන්/ ගමනාන්ත රටක් සඳහා අවශ්‍යතාවයක් ඇත්නම් පමණි.
6. සංචාරකයා දින දහහතරක් හෝ ඊට වැඩි කාලයක් රැඳී සිටින්නේ නම්, දෙවැනි PCR පරීක්ෂණය 11 වැනි දින සිට 14 වැනි දින දක්වා දිනවල දී සිදුකළ යුතුය.
7. පළමු දිනයේ ප්‍රතිඵල සෘණාත්මක ලෙස ලද පසුව, සංචාරකයින්ට ජෛව ආරක්ෂණ බුබුලක් තුළ අනුමත වැදගත් ස්ථාන නැරඹිය හැකිය.
8. දින දහහතරක් අවසන් වන තෙක් සංචාරකයින් විසින් හෝටල් වෙනස් නොකළ යුතුය. ඔවුන් දින 14 කට වඩා වැඩි කාලයක් රැඳී සිටින්නේ නම්, සෘණාත්මක PCR වාර්තා සමඟ 14 වැනි දින ඔවුන් මුදා හැරිය හැකිය.
9. උණ හෝ කොවිඩ්-19 හි රෝග ලක්ෂණ පෙන්නුම් කරන්නේ නම්, වහාම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතුය

10. පැමිණ දින 14 ක් අවසානයේ දී, පළමු දින සහ 11 වැනි දින සිට 14 වැනි දින දක්වා දිනවල සිදුකළ PCR පරීක්ෂණ ප්‍රතිඵල සෘණාත්මක නම්, සංචාරකයින් නිරෝධායන හෝටලයෙන් මුදා හැරිය හැකිය.

11. PCR පරීක්ෂණ ප්‍රතිඵලය ධනාත්මක නම්, හෝටල් කළමනාකාරිත්වය වහාම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිකාර ක්‍රියා පිළිවෙත අනුගමනය කළ යුතුය.

රටේ කොවිඩ්-19 වසංගත තත්ත්වය සහ ගෝලීය තත්වය අනුව මෙම මාර්ගෝපදේශය සමාලෝචනය කෙරේ.

මෙය මාගේ 2020.12.04 දිනැති සහ අංක DQ/06/2020 දරන 'කොවිඩ්-19 වසංගතය අතරතුර දී අනිවාර්ය/ දීර්ඝ කරන ලද නිරෝධායන කාල සීමාව තුළ හෝ ඉන් පසුව සහ හුදකලා කිරීමේ/ අතරමැදි සත්කාර මධ්‍යස්ථාන/ රෝහල්වලින් බැහැර වූ පසුව අනුගමනය කළ යුතු නිරෝධායන පියවර' යන මාතෘකාව සහිත ලිපිය සඳහා වන සංශෝධනයකි.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්